**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 23 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජූලි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) සභාවට අයත් රු.14,163,000 ක් වූ ඉඩම් කොටස් 03 ක් හා තක්සේරු වටිනාකම සඳහන් නොවූ ඉඩම් කොටස් 03 ක් වශයෙන් වූ ඉඩම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වරිපනම් වලට අදාල වරෙන්තු ගාස්තු බිල්කර ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසදු පාලන ගිණුම්

සේවක ඇප තැන්පත් හා සේවක ඇප ආයෝජන පිළිවෙලින් රු.894,226 ක් හා රු. 824,333 ක් වුයෙන් ගිණුම් දෙක අතර රු. 69,893 ක වෙනසක් සිදුවී තිබුණි.

### 1.3.3 ලැබියයුතු සහ ගෙවිය යුතු ගිණුම

වසර 2 සිට වසර 25 දක්වා කාලපරාසයක් තුල අයවීමකින් තොරව පවතින රු.25,496,371 ක්වූ මුදල අදාල ආයතනවලින් හෝ පුද්ගලයන්ගෙන් අයකර ගැනීම සඳහා සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද රු. 2,993,218 ක්වූ වියදම් ණයහිමි ශේෂය නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි.

**1.3.4 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තිරණ යනාදියට අනුකූල නොවීම**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

| නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත | |
| (I) 158 වගන්තිය | සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු නොගෙවා පැහැර හරින තැනැත්තන්ට අයත් චංචල දේපළ තහනමට ගෙන රු.20,022,285 ක් වූ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (II) 159 (1) වගන්තිය | ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු බදුකුලී රු.1,079,272 ක් සහ කඩකුලී රු.398,096 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (I) අංක 59 රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේදීම සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර අදාල වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (II) අංක 218 රීතිය | සභාවේ සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පරීක්ෂණයක් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.61,381,092 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.44,466,145 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු. 16,914,947 කින් වර්ධනයවීම සඳහා ආදායම් විෂයයන් පහක් රු.23,148,258 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂය අවසානයට රැස්කලයුතු වරිපනම් බදු ආදායමින් සියයට 52 ක්ද, අක්කර බදු ආදායමින් සියයට 85 ක්ද, වෙනත් ආදායම් සියයට 45 ක්ද අයවී නොතිබුණි.

**2.3.2 වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල් කල වරිපනම් බදු මුදල වූ රු.14,421,453 න් වර්ෂය තුලදී රැස්කරගෙන තිබුණේ රු.9,496,349 ක මුදලක් පමණි. එය බිල් කළ ආදායමින් සියයට 65 ක ප්‍රමාණයකි.

**2.3.3 උසාවි දඩ සහ මුද්දර ගාස්තු**

පහත කරුණු නිරීක්ෂණයවිය.

(අ). 2016 දෙසැම්බර් 31 දිනට පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් සභාවට අයවිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.133,662,254ක් විය. ඉන් රු.14,970,932 ක් 1991 සිට 2010 දක්වා වන අතර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ). 2016 දෙසැම්බර් 31 දිනට පළාත් ප්‍රධාන රු.20,799,438 ක් වූ උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අධිභාර වශයෙන් රු.47,728 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම මත සභාව වෙත රු.87,500 ක අධිභාර පනවා තිබුණි.

(ඇ) සතිපොල බදු දීම, වරිපනම් සහ කඩකුලී ගාස්තු වශයෙන් 2001 වර්ෂයේ සිට 2006 වර්ෂය දක්වා පුද්ගලයින් සිව්දෙනෙකුගෙන් ලැබී තිබුණු රු.502,997 ක් වටිනා චෙක්පත් අගරු වී ඇතත්, එම මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව අපොහොසත් වී තිබුණි.

(ඈ) නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් 2014 දෙසැම්බර් 19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (ආ) ඡේදය ප්‍රකාරව ආදායම් රැස්කිරීම පිළිබඳ ප්‍රසිද්ධ කල ගැසට් පත්‍රයෙහි දැන්වීම් පුවරු ආදායම් රැස්කිරීම පිළිබඳ සඳහන් කර නොතිබීම නිසා සභා බල ප්‍රදේශය තුල පිහිටි ස්ථිර දැන්වීම් පුවරු වලින් 2016 වර්ෂයේදී කිසිදු ආදායමක් රැස්කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ). නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ප්‍රධාන මාර්ග කි.මී. 35 ක පමණ වපසරියක් අයත් වන අතර ඉන් කිලෝ මීටර් 03 ක දුරක් එක් පැත්තක පමණක් සවිකර තිබුණු

දැන්වීම්පුවරු පිළිබඳ නියැදි පරීක්ෂාවේදී දැන්වීම් පුවරු 42 කින් රු.99,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඊ) ඉඩම් කට්ටිකර විකිණීමේදී පොදු පහසුකම් වෙනුවෙන් සභාවට ලබා දී තිබූ ඉඩම් කට්ටි සමීක්ෂණ මණ්ඩලයක් මගින් සමීක්ෂණය කර අයිතිය තහවුරු කරගෙන ආරක්ෂා කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(උ) 1994 සිට 2014 දක්වා සේවක ඇප රු. 91,694 ක් බැංකු ගිණුම්වල ආයෝජනය කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පෙර වර්ෂයට වඩා ප්‍රවර්තන වර්ෂයේ බිල්කල බලපත්‍ර ආදායම රු.3,868,091 කින් අඩු වී තිබුණි.

(ආ) 2015 වර්ෂයේ මාස 07 ක් තුල සැලසුම් 285 ක් අනුමත කර තිබුණ ද, 2016 වර්ෂයේ අගෝස්තු 31 වන විටත් අනුකූලතා සහතිකය ලබා ගෙන තිබුණේ ගොඩනැගිලි 09 ක් සඳහා පමණි. අනුකූලතා සහතික ලබා නොගත් ඉදිකිරීම් සඳහා සංවර්ධන අවසර පත්‍රයේ වලංගු කාලය දීර්ඝ කරගෙන නොතිබූ අතර සභාව විසින් ඒ සම්බන්ධ පරීක්ෂාවක් ද සිදුකර නොතිබුණි.

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------

ගෝඝාතකාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීම වෙනුවෙන් පුද්ගලයින් 04 දෙනෙකු වෙත එක් අයෙකුට රු.150,000 බැගින් රු.600,000 ක් අත්තිකාරම් වශයෙන් 2002 වර්ෂයේදී ගෙවා තිබුණද, මෙතෙක් එම ඉඩමෙහි අයිතිය ලබා ගැනීමට හෝ එම මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම්ගේ මිල කමිටු තීරණ අනුව 2016 වර්ෂය සඳහා බොරළු කියුබ් එකක අනුමත මිල රු.1,000 ක් ලෙස දක්වා තිබූ අතර එයට පටහැනිව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව විසින් බොරළු කියුබ් 01 ක් සඳහා රු.2,300 සිට රු.3,600 දක්වා මිල ගණන් 04 ක් යටතේ බොරළු කියුබ් 964 ක් මිලදී ගෙන රු.2,191,712 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) බොරළු ලැබීම් හා නිකුත් කිරීමේ ලේඛනය අනුව 2016 වර්ෂයේ මාස 7 ½ කාලයක් තුල බොරළු කියුබ් 883.9 ක් මාර්ගවලට හා කසළ වලවල්වලට නිකුත් කර තිබුණද, ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.

### 3.5 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සඛ්‍යාවට අනුව විධායක ශ්‍රේණියේ එක් පුරප්පාඩුවක්ද ද්විතියික හා ප්‍රාථමික දෙකෙහි එකතු අතිරික්ත කාර්ය මණ්ඩලය 86 දෙනෙක් විය.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය
-------------------------------------------

### 4.1 අයවැය පාලනය
-----------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රාග්ධන වියදමේ සියයට 196 ක විචලනයන් සිදුවී තිබීම තුල අයවැය ඇස්තමේන්තු පාලන කාරකයක් වශයෙන් සභාවේ කටයුතුවලදී ප්‍රයෝජනවත් වී නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය
----------------------

ආයතනයේ මුල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 ක්‍රියාකාරී සැලැස්ම
----------------------

2014 පෙබරවාරි 17 හා අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන දුර්වලතා සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | ඉඩම් හා ගොඩනැගිලිවල පැවැත්ම හා ආරක්ෂාව තහවුරු කර ගැනීමට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) | ණයගැතියෝ | පැරණි ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ණයහිමියෝ | පැරණි ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | සේවක ණය | අයවීමකින් තොරව පවතින සේවක ණය ශේෂ සම්බන්ධයෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඉ) | අයවැය | තුලිත අයවැය ලේඛනයක් පිළියෙල කර ගැනීමට අපොහොසත් වී තිබුණි. |
| (ඊ) | අභ්‍යන්තර විගණනය | නිවැරදි මුල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු , හිඟ ආදායම් රැස්කිරීම, විකල්ප ආදායම් මාර්ග හඳුන්වාදීම, වැඩ යෝජනා ක්‍රම හා ව්‍යාපෘති යන මේවායේ ප්‍රගතිය සොයා බැලීම සිදුකර නොතිබුණි. |